## ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය - 2023

-----------------------------------------------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මහලේකම් කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහලේකම් කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහලේකම් කාර්යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා දරන ලද වැටුප් වියදම වෙනත් ආයතන විසින් දැරීම හේතුවෙන් මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි තත්වයක් පිලිඹිබු නොවේ. ඒ අනුව වාර්ෂික වැටුප් වියදම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 127 ඡේදය ප්‍රකාරව සටහන් යටතේ හෙලිදරව් කර නොතිබුණි. | මෙම කාර්යාලය කාන්තා, ළමා කටයුතු හා සමාජසවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් එහි සියළුම නිලධාරීන්ට වැටුප් ගෙවනු ලබන්නේ එම අමාත්‍යාංශය මගින් බැවින් ජාතික මහ ලේකම් කාර්යාලයේ ගිණුමට ඇතුළත් නොකරන ලදී. නමුත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි 2024 වර්ෂයේ සිට වාර්ෂික වැටුප් වියදම සටහනක් ලෙස හෙලිදරව් කිරීමට කටයුතු කරන බව. | ආයතනයේ වාර්ෂික වැටුප් මූල්‍ය ප්‍රකාශනයේ හෙලිදරව් කල යුතුයි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද | 2024 වර්ෂය සඳහා ගිණුම් සකස් කිරීමේ දී එම පොලිය ගිණුම් ගත | ස්ථාවර තැන්පතු වලට අදාල පොලිය නිවැරදිව ගණනය කර |

| | | |
|---|---|---|
| රු.5,000,000 ක් වු ස්ථාවර තැන්පතු සඳහා වර්ෂයට අදාළ රු.1,021,574 ක් වු පොලී ආදායම ලැබිය යුතු ආදායම ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු පොලී ආදායම අඩුවෙන් දක්වා තිබුණු අතර රු.2,000,000 ක් වු ත්‍රෛයිමාසික ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලිය රු.211,744 ක් වුවත් රු.242,037 ක් වශයෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් රු.30,293 කින් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | කරන බව | ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | මහලේකම් කාර්යාලය සතු රු.2,658,666 ක් වු ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | මෙම ලේකම් කාර්යාලයේ සියළු ස්ථාවර වත්කම් පිළිබඳව අමාත්‍යාශය විසින් පරීක්ෂා කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භෞතික පරීක්ෂාවන් සිදුකර වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 15 වගන්තිය | කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රජයේ ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා කාර්යමණ්ඩලයේ තනතුරු 67 ක් අනුමත කර තිබුණි. නමුත් මේ සඳහා බඳවාගැනීමේ පටිපාටිය පිළියෙල කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම කර නොතිබුණු අතර බඳවාගැනීම් සිදු කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් 46 දෙනෙකු හා සමාජසේවා දෙපාර්තමේනතුවේ නිලධාරීන් 03 දෙනෙකුත් කාර්යමණ්ඩලය ලෙස මහලේකම් කාර්යාලයේ කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් 25 දෙනෙකු වෙනුවෙන් වාර්ෂික වැටුප් සඳහා අමාත්‍යාංශය විසින් රු. 15,430,524 ක් ද, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 3 දෙනෙකු සඳහා රු. 2,347,260 ක් | අමාත්‍යාංශයේම අංශයක් වශයෙන් ක්‍රියාත්මක වීම නිසා මහලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් දල වැටුප් ගෙවීම් සිදු කරනු ලබන බව. | පනත ප්‍රකාරව කටයුතු යුතුය. |

ද ගෙවා තිබුණ අතර නිලධාරින් 21 දෙනෙකු වෙනුවෙන් වැටුප් ගෙවීම් පිළිබඳව තොරතුරු ආයතනය සතුව නොපැවතුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.147,747,119 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 81,537,169 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 66,209,950 වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සුපිරි වාසනා ලොතරැයි ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතේ 13 වන වගන්තියේ (උ) වගන්තිය ප්‍රකාරව ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරිමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම හා (එ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාම කලයුතු වුවත් අදාල කාර්යයන් ඉටු කිරිමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම පියවර ගෙන නොතිබුණි. තවද පනතේ (ඕ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දිම හා පනතේ (ක) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ට නැවතිම් පහසුකම් සැපයීමේ ආයතන පිහිටුවීම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීමට රජය පුද්ගලයන් දිරිමත් කිරීම කලයුතු වුවද අදාල කාර්යයන් සිදුකර නොතිබුණි. | ආබාධ සහිත තැනැත්තන් හා දිගු කාලීන රෝගවලට ගොදුරු වූවන් තවදුරටත් ආබාධ සහිත තත්ත්වයට පත්වීම වැළැක්වීම අරමුණු කර ගනිමින් ආධාරක උපකරණ ලබාදීම හා වෛද්‍ය ආධාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන අතර ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කර ඇති බව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ආබාධ සහිත දරුවන් සඳහා රැකබලාගැනීම සඳහා ආයතන පිහිටුවා ඔවුන්ට වෘත්තීය පුහුණුව ද ලබා දෙනු ලබන බව හා චිකිත්සක ප්‍රතිකාර හා පෙර පාසැල් අධ්‍යාපනය ලබා දෙනු ලබන බව. | පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීමට අවධානය යොමු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනතේ I වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2023 වර්ෂයේදී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැලැස්ම සැකසීම, ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම ඇතුලුව ගනු ලැබූ වැදගත් තීරණ ක්‍රියාත්මක කිරිමට මේ දක්වා නොහැකි වී තිබුණි. | 2024 වර්ෂය තුළ ආබාධ සහිතභාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නියමිත බව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ සිදුකරන සමීක්ෂණ හරහා ලබා ගන්නා දත්ත හා එකී තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ බෙදා ගැනීමට නියමිත බවත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව අතර ආබාධ සහිත තැනැත්තන් උදෙසා රක්ෂණයක් ලබා දීම සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්වූ බව. | සභා තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලැබිය යුතු මුදල රු. 82,597,195 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඉන් රු. 24,050,000 ක් පමණක් ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාලව සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් කිසිදු මුදලක් ජාතික මහලේකම් කාර්යාලයට ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.225,104,617 ක් විය. මේ හේතුවෙන් අබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණ නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | මිය යාම, පදිංචිය හැර යාම, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, නිවාස සංවර්ධන අධිකාරිය හා ස්වේච්ඡා ආයතන ආදී ආයතන මගින් නිවාස තනා දීම නිවාස ආධාර ප්‍රතික්ෂේප කිරීම ආදී හේතුන් මත නිවාස ආධාර ප්‍රතික්ෂේප වී නැවත ලැබුණු මුදල් වලින්ද නැවත නිවාස ආධාර ලබා දීම ඉදිරියේ දී සිදු කරනු ලබන බව. | අරමුදලේ අරමුණු ඉටුවන ආකාරයට උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කළ යුතු අතර මුදල් ලබා ගැනීම් නිසි පරිදි කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ජාතික සභාවේදී වාර 04 කදී පමණ සාකච්ඡාවට ලක් කෙරුණු බස්නාහිර, දකුණ, මධ්‍යම සහ උතුර යන පළාත් 04 ආවරණය වන පරිදි රැකවරණ මධ්‍යස්ථාන 04 ක් ස්ථාපිත කිරීම වෙනුවට දකුණු පලාතේ අකුරැස්ස ප්‍රදේශයේ පමණක් මුල් ළමාවිය | ලෝක බැංකු ආධාර යටතේ ගොඩනැගිල්ල ඉදිකළ නමුත් එය පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන පවත්නා ආර්ථික වපසරිය තුල ලබා දෙනු ලැබුවේ ආසියානු සංවර්ධන ආධාර යටතේ වේ. ඒ අනුව 2024 ජුනි 30 දින වන විට උපකරණ ලබා ගැනීමට | මුල් ළමාවිය මධ්‍යස්ථානය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලැබූ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේ ජූනි 27 දින ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණු නමුත් මේ දක්වා මෙම මධ්‍යස්ථානය භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

නියමිත වේ. අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පරිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2024. පෙබරවාරි 26 දින අනුමැතියට ඉදිරිපත් කර ඇත. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව මෙහි රාජකාරී ආරම්භ කිරීමට නියමිතය.